16
පාඩම
षोडषः पाठः

# අනාගත කාල (ලෘඩ්) ක්‍රියා වරනැඟීම

## 16.1 ක්‍රියාකාරකම

අනාගත කාල (ලෘඩ්) ක්‍රියාපද වාචෝද්ගත කරමු.

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमपुरुष | भविष्यति<br>වන්නේ ය | भविष्यतः<br>දෙදෙන වන්නාහ | भविष्यन्ति<br>වන්නාහ |
| मध्यमपुरुष | भविष्यसि<br>වන්නෙහි | भविष्यथः<br>දෙදෙන වන්නෙහු | भविष्यथ<br>වන්නෙහු |
| उत्तमपुरुष | भविष्यामि<br>වන්නෙමි | भविष्यावः<br>දෙදෙන වන්නෙමු | भविष्यामः<br>වන්නෙමු |

## 16.2 ක්‍රියාකාරකම

අනාගත කාල ක්‍රියාපද හඳුනා ගෙන වාචෝද්ගත කරමු.

गमिष्यति - යන්නේ ය

लिखिष्यति - ලියන්නේ ය

वसिष्यति - වසන්නේ ය

धाविष्यति - දුවන්නේ ය.

खादिष्यति - කන්නේ ය



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

क्रीडिष्यति - ක්‍රීඩා කරන්නේ ය

वक्ष्यति - කියන්නේ ය

तरिष्यति - තරණය කරන්නේ ය

नमिष्यति - වඳින්නේ ය

पठिष्यति - පාඩම් කරන්නේ ය

## 16.1 අභ්‍යාසය

**පහත සඳහන් සිංහල වාක්‍ය සංස්කෘතයට පරිවර්තනය කර අතීත හා අනාගත කාලයට හරවා ලියන්න.**

1. ඔහු ගමට යයි.
2. මුනිවරයා අසපුවට යයි.
3. ළමයා ක්‍රීඩා කරයි.
4. වඳුරා ගෙඩිය කයි.
5. ඔහු කන්ද තරණය කරයි.
6. මම බුදුන් වඳිමි.
7. උපාසකයෝ බුදුන් වඳිති.
8. නුඹ ලියුමක් ලියහි.
9. අශ්වයෝ දෙදෙන දුවත්.
10. ශිෂ්‍යයා පොත පාඩම් කරයි.

## ෂෂ්ඨී, සප්තමී පද හඳුනාගනිමු.

❖ යමක හෝ යමකුගේ **අයිතිය** ප්‍රකාශ කිරීමට අවශ්‍ය වූ විට එය ෂෂ්ඨී විභක්තියෙන් යෙදේ.

උදාහරණ:- वृक्षस्य फलम्। - ගසේ ගෙඩිය

भूपालस्य रथः। - රජතුමාගේ රථය





❖ කර්තෘ විසින් කරනු ලබන ක්‍රියාව සිදු කිරීමට **ආධාර** වන **ස්ථානය** ප්‍රකාශ කරනු ලබන්නේ සප්තමී විභක්තියෙනි.

උදාහරණ:- विहगः कोटरे वसति।

කුරුල්ලා බෙනයෙහි වාසය කරයි.

हस्ते प्रदीपम् अस्ति।

අතෙහි පහනක් ඇත.





## 16.2 අභ්‍යාසය

පහත සඳහන් සංස්කෘත වාක්‍ය සිංහලයට නගන්න.

१ बालकस्य हस्ते पुस्तकम् अस्ति ।

२ शकुनाः आकाशे सञ्चरन्ति ।

३ मार्गेषु रथाः चलन्ति ।

४ वृक्षेषु विहगाः तिष्ठन्ति ।

५ वने गजाः चरन्ति ।

६ बालकाः उद्यानेषु क्रीडन्ति ।

७ यती आश्रमयोः जीवतः ।

८ विहगाः नीडेषु वसन्ति ।

९ देवस्य मन्दिरं विलसति ।

१० बालकानां गृहेषु वस्त्राणि सन्ति ।